මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

නිකුත් කළේ මූල්‍ය බුද්ධි ඒකකය
දිනය 2022 දෙසැම්බර් 12

**මූල්‍ය බුද්ධි ඒකකය විසින් මූල්‍ය ආයතන වල අනුකූලතාව බලාත්මක කිරීම සඳහා 2022 ජූලි 01 දින සිට 2022 නොවැම්බර් 16 දින දක්වා කාලපරිච්ඡේදය තුළ පරිපාලනමය දණ්ඩන පැනවීම/එකතු කිරීම**

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 19 (1) සහ 19 (2) වගන්ති මගින් පැවරී ඇති බලතල අනුව, එම පනතේ ප්‍රතිපාදනවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කරන ආයතන සඳහා මූල්‍යමය දණ්ඩන පනවනු ලැබේ. මූල්‍ය ආයතනයක් විසින් සිදුකරනු ලබන අදාළ අනුකූල නොවන කටයුතුවල ස්වභාවය හා බරපතලකම සැලකිල්ලට ගෙන මෙම දණ්ඩන නියම කළ හැකිය.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නියාමන ආයතනය ලෙස මූල්‍ය බුද්ධි ඒකකය විසින් මූල්‍ය ආයතනවල අනුකූලතාව බලාත්මක කිරීම සඳහා 2022 ජූලි 01 දින සිට 2022 නොවැම්බර් 16 **දින** දක්වා කාලය තුළ පහත දක්වා ඇති පරිදි එකතු කර ගන්නා ලද සමස්ත දඩ මුදල රුපියල් මිලියන 10.75 කි. දණ්ඩන මගින් එකතු කරන ලද මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරන ලදී.

**1. ඩී.එෆ්.සී.සී. බැන්ක් පී.එල්.සී**

| | | |
|---|---|---|
| **දණ්ඩනය පනවන ලද දිනය** | **:** | **2022 සැප්තැම්බර් 08** |
| **වටිනාකම (රුපියල්)** | **:** | **4,000,000.00 (රුපියල් මිලියන හතරකි)** |
| **දණ්ඩනය ගෙවන ලද දිනය** | **:** | **2022 ඔක්තෝබර් 07** |

**දණ්ඩනය පැනවීමට හේතුව:**

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 2, 5(b), 6, 14(1)(b)(iii) වගන්ති වලට සහ 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතිවල ඇතුළත් අංක 7, 8, 9, 10, 27(2) යන රීතින්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදී.

**2. මහජන බැංකුව**

| | | |
|---|---|---|
| **දණ්ඩනය පනවන ලද දිනය** | **:** | **2022 සැප්තැම්බර් 08** |
| **වටිනාකම (රුපියල්)** | **:** | **2,000,000.00 (රුපියල් මිලියන දෙකකි)** |
| **දණ්ඩනය ගෙවන ලද දිනය** | **:** | **2022 ඔක්තෝබර් 11** |

**දණ්ඩනය පැනවීමට හේතුව:**

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා (UNSCR) යටතේ නම් කරන ලද ආයතන හෝ පුද්ගලයන් සමග ව්‍යාපාර සම්බන්ධතා නොපවත්වන බවට සහතික වීම සඳහා, ආයතනයේ පවත්නා මුළු ගනුදෙනුකාර පදනම හෝ පවතින සියළුම ව්‍යාපාරික සම්බන්ධතා පිරික්සීමට අපොහොසත් වීම නිසා මහජන බැංකුව විසින් 2012 අංක 1 දරණ එක්සත් ජාතීන්ගේ රෙගුලාසි යටතේ නම් කරන ලද පුද්ගලයන් සමග ව්‍යාපාරික සම්බන්ධතා පැවැත්වූ අවස්ථා නිරීක්ෂණය වීම හේතුවෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදී.

**3.** ලංකා බැංකුව

| | | |
|---|---|---|
| **දණ්ඩනය පනවන ලද දිනය** | **:** | **2022 ඔක්තෝබර් 13** |
| **වටිනාකම (රුපියල්)** | **:** | **3,000,000.00 (රුපියල් මිලියන තුනකි)** |
| **දණ්ඩනය ගෙවන ලද දිනය** | **:** | **2022 නොවැම්බර් 14** |

**දණ්ඩනය පැනවීමට හේතුව:**

එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා යටතේ නම් කරන ලද ආයතන හෝ පුද්ගලයන් සමග ව්‍යාපාර සම්බන්ධතා නොපවත්වන බවට සහතික වීම සඳහා, ආයතනයේ පවත්නා මුළු ගනුදෙනුකාර පදනම හෝ පවතින සියළුම ව්‍යාපාරික සම්බන්ධතා පිරික්සීමට අපොහොසත් වීම නිසා ලංකා බැංකුව විසින් 2012 අංක 1 දරණ එක්සත් ජාතීන්ගේ රෙගුලාසි යටතේ නම් කරන ලද පුද්ගලයෙකු සමග ව්‍යාපාරික සම්බන්ධතා පැවැත්වූ අවස්ථා නිරීක්ෂණය වීම හේතුවෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදී.

**4.** නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී.එල්.සී

| | | |
|---|---|---|
| **දණ්ඩනය පනවන ලද දිනය** | **:** | **2022 ඔක්තෝබර් 13** |
| **වටිනාකම (රුපියල්)** | **:** | **1,000,000.00 (රුපියල් මිලියනයකි)** |
| **දණ්ඩනය ගෙවන ලද දිනය** | **:** | **2022 නොවැම්බර් 14** |

**දණ්ඩනය පැනවීමට හේතුව:**

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 2, 5(b), 6, 14(1)(b)(iii) වගන්ති වලට සහ 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතිවල ඇතුළත් අංක 7, 8, 9, 10, 27(2) යන රීතීන්ට අනුකූල නොවීම සම්බන්ධයෙන් මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදී.

**5.** **ජාතික ඉතිරිකිරීමේ බැංකුව**

| | | |
|---|---|---|
| **දණ්ඩනය පනවන ලද දිනය** | **:** | **2022 ඔක්තෝබර් 13** |
| **වටිනාකම (රුපියල්)** | **:** | **750,000.00 (රුපියල් හත්ලක්ෂ පනස් දහසකි)** |
| **දණ්ඩනය ගෙවන ලද දිනය** | **:** | **2022 නොවැම්බර් 14** |

**දණ්ඩනය පැනවීමට හේතුව:**

2018 ජූනි 20 දිනැති අංක 2076/18, 2019 මැයි 23 දිනැති අංක 2124/32 සහ 2019 සැප්තැම්බර් 09 දිනැති අංක 2140/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයන්හි පළ කරන ලද 2012 අංක 1 දරණ එක්සත් ජාතීන්ගේ රෙගුලාසි යටතේ නම්කර ඇති පුද්ගලයන්ගේ හා ආයතනවල සම්පූර්ණ ලැයිස්තුවක් පවත්වාගෙන යාමට අපොහොසත් වීම නිසා මෙම පරිපාලනමය දණ්ඩනය පනවන ලදී. පද්ධති හා ක්‍රියාපටිපාටිවල දුර්වලතා නිරීක්ෂණය වුවද, ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ යෝජනා යටතේ සම්බාධක සම්බන්ධව නම් කරන ලද පුද්ගලයන් හෝ ආයතන සමග ව්‍යාපාරික සම්බන්ධතා පැවැත්වූ අවස්ථා එතැන් පරීක්ෂණයේ දී අනාවරණය නොවීය.